# නිවේදනය

## උතුරු මැද පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවේ III ශ්‍රේණියේ අභ්‍යන්තර විගණන නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2026

උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද උතුරු මැද පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන නිලධාරි තනතුරට අදාළ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියෙහි විධිවිධානයන්ට අනුකූලව එම තනතුරෙහි පවතින පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2026.10.19 දින වන අතර, මෙම විභාගය 2026 නොවැම්බර් මස පැවැත්වේ.

පුරප්පාඩු සංඛ්‍යාව - 02

**01.මූලික සුදුසුකම්**

**01.1. අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සුදුසුකම් / පළපුරුද්ද**

I. උතුරු මැද පළාත් සභාවේ සේවය කරනු ලබන වසර තුනකට (03) නොඅඩු සේවා කාලයක් ඇති සේවය ස්ථිර කරන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ගණකාධිකරණය, කළමනාකරණය, වාණිජ්‍ය විද්‍යාව රාජ්‍ය මූල්‍ය හා බදුකරණය, ගණිතය ,ආර්ථික විද්‍යා විශේෂවේදී උපාධිධාරියෙකු වීම

හෝ

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආවසරික හෝ අන්තර් මධ්‍ය පරීක්ෂණය සමත්වී තිබීම

හෝ

වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ මධ්‍ය පරීක්ෂණයෙන් සමත් වී තිබීම

හෝ

ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයේ උසස් ජාතික ගණකාධිකරණ / වාණිජ ඩිප්ලෝමාව සමත් වූ සංවර්ධන නිලධාරි හෝ උපාධිය සුදුසුකමක් වූ තනතුරක සේවය කරන නිලධාරියෙකු වීම

හෝ

II. උතුරු මැද පළාත් සභාවේ සේවය කරනු ලබන වසර පහකට (05) නොඅඩු සේවා කාලයක් ඇති සේවය ස්ථිර කරන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ගණකාධිකරණය, කළමනාකරණය, වාණිජ්‍ය විද්‍යාව රාජ්‍ය මූල්‍ය හා බදුකරණය, ගණිතය ,ආර්ථික විද්‍යා විශේෂවේදී උපාධිධාරියෙකු වීම

හෝ

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආවසරික හෝ අන්තර් මධ්‍ය පරීක්ෂණය සමත්වීම

හෝ

වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ මධ්‍ය පරීක්ෂණයෙන් සමත්වී තිබීම

හෝ

ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයේ උසස් ජාතික ගණකාධිකරණ / වාණිජ ඩිප්ලෝමාව සමත් වූ උතුරු මැද පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරි සේවයේ නිලධාරියෙකු වීම.

**01.02.සුදුසුකම්:**

I. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරු මනා ශාරීරික සෞඛ්‍ය තත්වයකින් හා විශිෂ්ඨ චරිතයකිත් යුක්ත විය යුතුය.

III. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න කාලය තුළ උතුරු මැද පළාත් සහා බල ප්‍රදේශයේ ආසන්න වසර 03 ක කාලයක් අයදුම්කරුගේ ස්ථිර පදිංචිය සනාථ කල යුතුය. පදිංචිය සනාථ කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයේදි පහත සඳහන් ලිපිලේඛණ ඉදිරිපත් කල යුතුය. ( අයදුම්කරු මෙම පළාතේ වසර තුනකට (03) වඩා ස්ථිර පදිංචි අයෙකු සමග විවාහ වූ විට කලත්‍රයාගේ ස්ථිර පදිංචිය සලකා බැලේ)

(අ) මැතිවරණ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඡන්ද හිමි නාමලේඛණ උද්ධෘතය සහ
(ආ) ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය . (DS - 4 ආකෘතිය)

**02. කායික සුදුසුකම්:**

සෑම අයදුම්කරුවෙකුම උතුරු මැද පළාතේ කවර හෝ ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් , සුදුසු ශාරිරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**03. වයස:**

අවම සීමාව - අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 හෝ ඊට වැඩි විය යුතුය.

උපරිම සීමාව - අදාල නොවේ

**04. වෙනත්:**

I. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

II. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

III. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර පුරප්පාඩු පුරවන දිනට පූර්වාසන්න වසර 03 ක කාලය තුළ අවවාද කිරිම් හැර විනය දඬුවමකට ලක් නොවූ අයෙකු විය යුතුය.

IV. යම් ආගමික නිකායක පැවදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොදරයි.

**05.බඳවා ගන්නා ප්‍රතිශතයන්**

- පවතින පුරප්පාඩු වලින් 30%ක් සීමිත අයදුම්කරුවන්ගෙන් බඳවා ගනු ලැබේ.

සටහන - උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත එහි ලේකම් විසින් පවත්වනු ලබන තරඟ විභාගයකින් හා සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසු උතුරු මැද පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන නිලධාරි iii ශ්‍රේණියේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගනු ලැබේ. එම විභාගයේ ප්‍රථිඵල අනුව සීමිත ධාරාව යටතේ සුදුසුකම් ලබන අයගේ සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවෙන් 30% ට අඩු වන්නේ නම් එම වෙනසේ ප්‍රමාණය විවෘත තරඟ විභාගයේ ප්‍රථිඵල අනුව සුදුසුකම් ලැබූ අයගෙන් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

**06.** බඳවා ගැනීමේ ක්‍රමය:

**06.1**. උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සහ මුලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත, කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් බඳවා ගැනීම සිදු කරනු ලැබේ. බඳවා ගන්නා අවස්ථාවේදී පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව සීමිත තරඟ විභාගයෙන් සමත් වන අයදුම්කරුවන්ගෙන් සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන අයදුම්කරුවන් බඳවා ගන්නා අතර, බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ බලය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

**06.2**. ලිඛිත විභාගය : ලිඛිත විභාගයක ප්‍රතිඵල මත පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකින් පසු බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගයේ එක් එක් විෂය සඳහා 40% කට වඩා සෑම විෂයක් සඳහාම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට ලබා ගත් මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල මත ඉහළම ලකුණු ලබා ඇති අය පුරප්පාඩු සංඛ්‍යාවෙන් 30% ක පුරප්පාඩු ගණනට සමාන ප්‍රමාණයක් තනතුරට බඳවා ගනු ලැබේ. බඳවා ගනු ලබන සංඛ්‍යාව මෙන් දෙගුණයකට සමාන ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. (පවත්නා හෝ බඳවා ගන්නා පුරප්පාඩු සංඛ්‍යාව ආයතනයේ අවශ්‍යතාවය හා ඒ ඒ අවස්ථාවේදී පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරනු ලබන සංඛ්‍යාවක් විය හැකිය. (මේ සම්බන්ධයෙන් අවසන් තීරණය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.)

**06.3.** ලිඛිත තරඟ විභාගයට අදාළ විෂයන්.

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රතිශතය |
|---|---|---|
| මූල්‍ය ගණකාධිකරණය | 100 | 40% |
| පිරිවැය හා කළමනාකරණ ගණකාධිකරණය | 100 | 40% |
| විගණනය හා විමර්ශනය | 100 | 40% |
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | 100 | 40% |
| අවබෝධය හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |

බඳවාගැනීමට අදාල ලිඛිත විභාගය අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවත්වනු ලැබේ.

**06.3.1.** මාධ්‍ය

විභාගය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පැවැත්වේ . ඔබ කැමති භාෂා මාධ්‍යයකින් ඉල්ලුම් කල හැකිය.

**06.3.2.විෂය නිර්දේශය**

| **ප්‍රශ්ණ පත්‍රය** | **විෂය නිර්දේශය** | **කාලය** | **ලකුණු ප්‍රමාණය** |
|---|---|---|---|
| විෂයයඅංක 01 – ගණකාධිකරණය | ගණකාධිකරණ න්‍යාය - මූලික සංකල්ප හා මූලධර්ම, වත්කම් ඇගයීමේ ක්‍රම ද්විත්ව සටහන් න්‍යාය, පිරිවැය වර්ගීකරණය ශේෂ පත්‍ර වල තොරතුරු වර්ගීකරණය, නිෂ්පාදන, වෙළඳ හා ලාභාලාභ ගිණුම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය.<br>• ගණකාධිකරණ පද්ධති - ගිණුම් ඒකකයක උපයෝගී කරගනු ලබන සම්පත්වල වෙනස්වීම් පාලනය කිරීමේ අවශ්‍යතාවය පදනම් කරගත් පාලන සංකල්ප පිළිබඳ අවබෝධය, ප්‍රමිතයන් සමග සැසඳීමේ අවශ්‍යතාවය, ව්‍යාපාරික ගණුදෙනු විශ්ලේෂණය, මිලදී ගැනීම, වෙළඳාම මුදල් ලැබීම් හා ගෙවීම් ඉන්වෙන්ට්‍රි පාලනය ආදී මූලික කළමනාකරිත්ව කාර්ය භාරයන්ට අදාළ පරිපාටි | පැය 03 | **100** |

| | | | |
|---|---|---|---|
| | පිළිබඳ නිපුණත්වය, දෛනික පොත් ලෙජර්, පාලන ගිණුම් ආදී වාර්තා සැලසුම් ආකෘති පිළිබඳ නිපුණත්වය<br>• ශේෂ පත්‍ර සකස් කිරීම, නිෂ්පාදන, වෙළඳ හා ලාභාලාභ ගිණුම්, සැසඳීම් ප්‍රකාශ, පාලන ගිණුම්<br>• ගණකාධිකරණ ප්‍රමිත | | |
| විෂයයඅංක 02 – පිරිවැය සහ කළමනාකරණ ගණකාධිකරණය | පිරිවැයකරණ මූලධර්ම, පිරිවැයකරණ වර්ග, මිලදී ගැනීම් හා ගබඩා පරිපාටි, ද්‍රව්‍ය, ද්‍රව්‍ය මිල කිරීම්, ද්‍රව්‍ය නිකුතු මිල කිරීම, වේතන, පොදු කාර්ය පිරිවැය, ස්ථාවර හා විචල්‍ය වියදම්, සෘජු හා වක්‍ර වියදම්, අයවැය ලේඛණමය පාලනය, ප්‍රමිත පිරිවැයකරණය, විචලනයන්, ආන්තික පිරිවැයකරණය | පැය 03 | 100 |
| විෂයයඅංක 03 – විගණනය හා විමර්ශනය | විගණන සංකල්ප හා න්‍යාය - විගණනයක අවශ්‍යතාවය, ගණන්දීමේ වගකීම විගණනයේ පදනමක් වශයෙන් විගණන විෂය පථය , විගණන වර්ග, විගණන කාලනිර්ණය, විගණකවරුන්ගේ සුදුසුකම්, බලතල, විගණනය සඳහා අධිකාරි බලය, පූර්ව විගණනය, අභ්‍යන්තර සෝදිසිය, අභ්‍යන්තර පාලනය ගැඹුරින් විගණනය, අභ්‍යන්තර විගණනය, ප්‍රමිත සඳහා වන අවශ්‍යතාව, විගණනය සඳහා සාක්ෂි වර්ග , ශිල්පීය ක්‍රම<br>• විගණන ප්‍රමිත<br>• විගණන පද්ධති සහ පරිපාටි, ශේෂ පත්‍රය නිෂ්පාදන, වෙළඳ හා ලාභාලාභ ගිණුම් ,ඉඩම්, ගොඩනැගිලි ස්ථාවර වත්කම් ඉන්වෙන්ට්‍රි මුදල්මය වත්කම්, විකුණුම් මිලදී ගැනුම්, ලැබීම්, ගෙවීම් ආදිය ආවරණය වන විගණන වැඩසටහන් පිළිබඳ නිපුණත්වය<br>• විගණන ගැටළු - නිරීක්ෂණ හැකියාවන් සහ වැරදි සහ අසාමාන්‍ය අවස්ථාවන් සොයා බැලීමේ හැකියාව පිරික්සීම සඳහා වන සරළ ගැටළු<br>• විගණකාධිපතිවරයාගේ කාර්යයන්<br>• විමර්ශන:<br>විමර්ශනයට අදාල විෂය ක්ෂේත්‍රය සැළසුම් කිරීම භාවිතා කලයුතු ශිල්ප ක්‍රම හා පිළිවෙත්, විමර්ශන මෙහෙයවීමේ අභිප්‍රාය පිළිබඳ උදාහරණ ;<br>ශක්‍යතා අධ්‍යයන, මිලට ගැනීම්, විකුණුම් ,ණයට දීම්, මිල නියම කිරීම ආදිය සඳහා ව්‍යාපාර ආයතන ඇගයීම, කාර්ය පත්‍රය සඳහා ගණකාධිකාරිගේ හා විගණකගේ වාර්තා, වාර්තාකරණ කාර්යයන් වංචා විමර්ශන ,ව්‍යාපෘති ඇගයීම<br>වාර්තාකරණ කාර්යයන්:<br>අභ්‍යන්තර පාලන පද්ධතිවල දුර්වලතා කළමනාකරණයට වාර්තා කිරීම.රජයේ හා සංස්ථා විගණනයට විශේෂ වාර්තාකරණ කාර්යය, කාර්ය පත්‍රය සඳහා වාර්තා, විමර්ශනය පිළිබඳ වාර්තා. . | පැය 03 | 100 |
| විෂයය අංක 04 – රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | රජයේ මුදල් පිළිබඳ නෛතික රාමුව:<br>ඒකාබද්ධ අරමුදල ,විශේෂ නීති විෂයගත වියදම්, ප්‍රතිශ්චිත අවසාන අරමුදල , රාජ්‍ය ණය, විදේශ ආධාර<br>**කාර්යභාරය:**<br>පාර්ලිමේන්තුවේ, මුදල්අමාත්‍යවරයාගේ භාණ්ඩාගාරයේ, විගණකාධිපතිවරයාගේ, රාජ්‍ය ගිණුම් කාරක සභාවේ, රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ, ප්‍රධාන ගණක නිලධාරියාගේ,<br>අයවැය ක්‍රමය හා පරිපාටි / වාර්ෂික ආදායම් හා වියදම් | පැය 03 | 100 |

| | | | |
|---|---|---|---|
| | ඇස්තමේන්තු ,අයවැය ක්‍රියාත්මක කිරීම, අයවැය ක්‍රියාත්මක කිරීම සඳහා සංවිධාන ව්‍යුහය, ආදායම් රාශිකරණ පටිපාටිය, ගෙවීම් කිරීම සඳහා අග්‍රිමය, වීරමොං පටිපාටිය , පරිපූරක ඇස්තමේන්තු අයවැය පාලනය, සැපයීම් පටිපාටිය රජයේ ගිණුම් ක්‍රමය හා පටිපාටි, රජයේ දේපල භාරය, ආරක්ෂාව හා පාලනය ආදායම් හා අනිකුත් ලැබීම් සඳහා ගිණුම්කරණය, වියදම් හා අනිකුත් ගෙවීම් සඳහා ගිණුම්කරණය, විදේශ ආධාර සඳහා ගිණුම්කරණය, පාඩු අත්හැරීම් හා කපා දැමීම් සඳහා ගිණුම්කරණය, | | |
| විෂයය අංක 05 – අවබෝධය හා සාමාන්‍ය බුද්ධිය | “අ” කොටස - අවබෝධය<br>දෙනු ලබන ඡේදයක් පදනම් කොටගෙන අයදුම්කරුවන්ට ප්‍රශ්ණ යොමු කරනු ලැබේ. තවත් ඡේදයක් දෙනු ලබන අතර, අයදුම්කරුවන් විසින් එහි මුඛ්‍ය අදහස ඡේදයේ වචන ගණනින් තුනෙන් එකක් වන සේ සාරාංශ කොට ලිවිය යුතුය.<br>“ආ” කොටස - සාමාන්‍ය බුද්ධිය<br>පදයක සංඛ්‍යාත්මක හා රූපාකාර සංදර්භයක් තුල ඉදිරිපත් කෙරෙන ගැටළු සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ නිගමනයන් හා ප්‍රතිචාර පරීක්ෂා කිරීම තුලින් අයදුම්කරුවන්ගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය හා බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ. | පැය 02 | 100 |

**07.වැටුප් ක්‍රමය**

අංක 10 / 2025 හා 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, උතුරු මැද පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන නිලධාරි තනතුර සඳහා iii ශ්‍රේණියේ MN 4 - 2025 වන අතර, මාසික වැටුප් පරිමාණය
53060 - 10x800 - 11x1190 - 10x1320 - 5x1350 - 94100 වේ.

**08. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි**

**(අ)** මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට ඔබ යටත් විය යුතු වේ.
(ආ) බඳවාගනු ලබන අයදුම්කරුවන් වසර 01 ක පරිවාස කාලයකට යටත් වන්නේය. නිලධාරියා උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් වීම හා නිලධාරියාගේ වැඩ හැසිරීම හා පැමිණීම සතුටුදායක බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා සෑහීමකට පත්වන්නේ නම් එම වසර අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබේ.
(අ) අයදුම්පත් තම අත්අකුරෙන් සකස් කළ යුතුය.අංක 01 සිට 03 දක්වා ශීර්ෂ පළමුවන පිටුවටද , අංක 04 සිට 08 දක්වා ශීර්ෂ දෙවන පිටුවටද,අංක 09 සිට 12 දක්වා ශීර්ෂ තෙවන පිටුවටද ඇතුළත් වන පරිදි සකස් කර ඊට අදාල තොරතුරු පැහැදිළිව ඇතුලත් කළ යුතුය. අයදුම්පත් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.nc.gov..lk මගින්ද ලබා ගත හැක.

**09.** **ඉල්ලුම් කළ යුතු පිළිවෙල**

I. මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 (සෙ.මී.21x30) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර **2026.10.19** වන දිනට පෙර **"ලේකම් ,උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය,අනුරාධපුර"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"උතුරු මැද පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය 2026 "** යනුවෙන් සඳහන් කල යුතුය. කිසිදු සහතික පත්‍රයක් / ජායා පිටපතක් ,අයදුම්පත සමග අමුණා නොඑවිය යුතුය. අයදුම්පත්‍රයේ ජායාපිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

II. අයදුම්පත් සකස් කල යුත්තේ තමා විභාගයට පෙනී සිටීමට කැමති භාෂා මාධ්‍යයෙනි. භාෂා මාධ්‍යය පසුව වෙනස් කළ නොහැකිය.

III. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් හෝ අයදුම්පත් කැඳවන අවසාන දිනට පසුව මුදල් ගෙවූ කුවිතාන්සි ඇතුළත් අයදුම්පත්, මුදල් ගෙවූ කුවිතාන්සි අලවා නොමැති අයදුම්පත් හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව මෙම කොමිෂන් සභාව විසින් වගකියනු නොලැබේ.අයදුම්පත් ලද බව හෝ ප්‍රතික්ෂේප කල බව අයදුම්කරුවන් වෙත දන්වනු නොලැබේ.

iv. අයදුම්පතේ සඳහන් අයදුම්කරුගේ අත්සන තම දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

**10.** විභාග ගාස්තු

(අ) විභාග ගාස්තුව රු:1200.00 කි . මෙම මුදල අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ එදිනට පෙර උතුරු මැද පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට උතුරු මැද පළාත් සභාවේ 2003-02-13 ආදායම් ශීර්ෂයට බැර වන ලෙස ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන එන්සී 100 රිසිට්පත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. කුමන හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, ගාස්තුව වෙනත් විභාගයකට මාරු කිරීමටද ඉඩ දෙනු නොලැබේ එසේම මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ. විභාග ගාස්තු ගෙවනු නොලබන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.(රිසිට්පතේ ජායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගැනීම සුදුසුය.)

(ආ) අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම හෝ ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. තවද අපේක්ෂකයන් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම ප්‍රශ්ණ පත්‍රයක් සඳහාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කල යුතුය.ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කල යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

විභාගය පැවැත්වීමට නියමිත දිනට දින 07 ට කලින් විභාග ප්‍රවේශ පත්‍ර නොලද අපේක්ෂකයන් පහත සඳහන් විස්තර ඇතිව උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලිඛිතව හෝ දුරකථන අංක 025 2222773 ඔස්සේ දැන්විය යුතුය.

**11. සාවද්‍ය තොරතුරු සැපයීම**

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ,විභාගය පැවැත්වීමට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගය පැවැත්වීමෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුවද, අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු /ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

මෙම නිවේදනයේ සඳහන් නොවන වෙනත් ඕනෑම කරුණක් පිළිබඳව අවසාන තීරණයක් ගැනීමේ බලය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන්නේය.

ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු මැද පළාත
2026.09.18